# අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන
# රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
# ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

# ඇබෑර්තු

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## තනතුර : සහකාර වතු අධිකාරී

**සුදුසුකම්** : 1) **බාහිර අයදුම්කරුවන් (පහත 1, 2 හෝ 3)**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, කෘෂිකර්ම/ වැවිලි කළමනාකරණ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක්

2) තෘතියික හා වෘත්තීය අධ්‍යයන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය පුහුණු ආයතනයකින්/ ජාතික වැවිලි කළමනකරණ ආයතනය මගින් නිකුත් කළ තේ වැවිලි ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් 6 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාතිබීම.

**සමග**

අදාළ ක්ෂේත්‍රයේ, සංස්ථාවක, මණ්ඩලයක, ප්‍රාදේශීය වැවිලි සමාගමක හෝ ප්‍රසිද්ධ ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් වසර පහක (05) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

3) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ තේ වැවිලි ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් 5 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**සමග :**

අදාළ ක්ෂේත්‍රයේ, සංස්ථාවක, මණ්ඩලයක, ප්‍රාදේශීය වැවිලි සමාගමක හෝ ප්‍රසිද්ධ ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් වසර දහයක (10) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**අමතර ප්‍රතිලාභ :** අභ්‍යන්තර හා බාහිර වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ පහසුකම්.

සේවකයා විසින් තම වැටුපෙන්, සේවක අර්ථසාධක අරමුදලට හෝ ලංකා වැවිලිකරුවන්ගේ අර්ථ සාධක අරමුදලට අවම 10% ප්‍රමාණයකින් දායක විය යුතු අතර, SLSPC ආයතනය විසින්, එවන් අර්ථ සාධක අරමුදල සඳහා 12% ප්‍රමාණයකින් හා සේවක භාර අරමුදලට 3% ප්‍රමාණයකින් දායකත්වය ලබා දෙනු ඇත.

අධීක්ෂණ කටයුතු සඳහා මෝටර් සයිකලයක් හෝ දීමනාවක් සමග ඉන්ධන කෝටාවක් ලබාදෙනු ඇත.

ගෘහභාණ්ඩ සහිත බංගලාවක් සමග එක් අයෙක් බැගින් වූ බාහිර හා අභ්‍යන්තර ගෘහසේවක දීමනාවක් ලබාදේ.

**වැටුප් පරිමාණය :** අංක 02/ 2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව අදාළ තනතුර සඳහා, **JM 1-1-2016 රුපියල් (42,600-10x755-18x1,135-70,580)** වැටුප් පරිමාණයක් හිමිවේ.

**වයස :** අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :** පත්කිරීමේ බලධාරියා විසින් පත්කළ අගැයුම් මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් ලද ප්‍රතිඵල මත සිදු කෙරේ.

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :**

- අමතර අදාළ පළපුරුද්ද – ලකුණු 30
- අදාළ අමතර සුදුසුකම් – ලකුණු 30
- වෙනත් ජයග්‍රහණ – ලකුණු 15
- සම්මුඛ පරීක්ෂණයේදී කාර්යසාධනය – ලකුණු 25

**ලකුණු 100**

**වෙනත් :** මෙම වර්ගීකරණය සඳහා බඳවා ගැනීම්, බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයේ ප්‍රතිපාදන අනුවම සිදු කෙරේ.

සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

තනතුරට අදාළව රාජකාරී නිසි අයුරින් ඉටුකිරීමට මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකිවන පරිදි ඉහළ කායික හා මානසික ස්වභාවයෙන් යුක්ත විය යුතුය.

විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**අයදුම්පත් :** අයදුම්කරුවන් විසින්, සියලු ජීවදත්ත විස්තර හා උප්පැන්න සහතිකය, අධ්‍යාපනික සහතික හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමග, පහත සඳහන් ලිපිනය වෙත ලැබෙන සේ, ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අදාළ භාරගැනීමේ කාලය අවසන්වූ පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

රජයේ සේවයේ / ව්‍යවස්ථාපිත මණ්ඩලවල / සංස්ථාවල අයදුම්කරුවන්, තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුවේ.

**අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනය :** 2024 ජූලි 01 වන දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනය වෙත ලැබීමට සැලැස්විය යුතුය.

**සභාපති,**
**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව,**
**අංක 257, සිරිධම්ම මාවත, කොළඹ 10.**

2024-06-11